**ශීර්ෂය 325 - ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 325 - ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජූලි 24 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 නොවැම්බර් 30 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 05/2023 හි 06 වගන්තිය ප්‍රකාරව දක්වා තිබූ ආකෘතිය දෙපාර්තමේන්තුව විසින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී භාවිතා කර තිබුණද, වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද රු. 12,455,733 ක් වූ වියදම හා භාණ්ඩාගාරයට පියවන ලද රු. 91,162 ක් වූ අග්‍රිම වට්නාකම මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ වෙන් වෙන් වශයෙන් දක්වා නොතිබුණි. | යම් අතපසුවීමක් හේතුවෙන් අදාල වටිනාකම් 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශයේ වෙන්වෙන් වශයෙන් දක්වා නොතිබුණු අතර, මෙවැනි අතපසුවීම් ඉදිරි මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීමේදී ඇති නොවීමට කටයුතු යොදන ලද බව. | චක්‍රලේඛ ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) පුනරාවර්තන වියදම්

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ ඉන්ධන සඳහා වූ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රු. 2,400,000 ක් වූ අතර තථ්‍ය මුළු වියදම රු. 532,118,353 ක් විය. ඒ අනුව ඇස්තමේන්තුවට වඩා ඉන්ධන වියදම රු. 529,718,353 ක් එනම් සියයට 22,071 කින් වැඩි වී තිබුණු අතර ඇස්තමේන්තු ප්‍රමාණවත් නොවීම මත අතිරේක ඉන්ධන ප්‍රතිපූර්ණය කර ගැනීමකින් තොරව නාවික හමුදාවෙන් ඉන්ධන ලබා ගෙන තිබුණි. එම වියදම දෙපාර්තමේන්තුවේ වියදම් ප්‍රකාශයේ හෝ අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ වියදමක් ලෙස දක්වා නොතිබුණි. | 2023 වසරට පෙර මෙම දෙපාර්තමේන්තුවට අවශ්‍ය ඉන්ධන පසුව ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත ශ්‍රී ලංකා නාවික හමුදාව වෙතින් ලබා ගත්තද ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙතින් ඉන්ධන සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන දිගින් දිගටම ප්‍රමාණවත් නොවීම මත එම ඉන්ධන වටිනාකම නාවික හමුදාව වෙත නැවත ප්‍රතිපූර්ණය කිරීමට නොහැකි වී ඇත. 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ඉන්ධන අවශ්‍යතාවය ප්‍රතිපූර්ණය කිරීමකින් තොරව නාවික හමුදාව වෙතින් ලබාදීමට අවශ්‍ය අනුමැතිය 2022 ඔක්තෝබර් මස 12 වන දිනැති අංක MOD/FIN/06/02/05/(15) දරණ ලිපිය මඟින් ආරක්ෂක ලේකම් විසින් ලබා දී ඇත. එම අනුමැතිය මත කටයුතු කරන ලද අතර, රථ වාහන හා යන්ත්‍ර සූත්‍ර වලට අදාල | වියදම් නිසි පරිදි පුරෝකථනය කර වැය විෂයයට අවශ්‍ය ප්‍රතිපාදන සලසා ගැනීමට කටයුතු කළ යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| | | ලිහිසි තෙල් අවශ්‍යතාවය සඳහා පමණක් ඇස්තමේන්තුගත ප්‍රතිපාදන යොදා ගැනීමට කටයුතු කරන ලදී. | |
| (ii) | දෙපාර්තමේන්තුවේ රාජකාරී කටයුතු සිදු කරන නිලධාරීන් හා නාවිකයන් හට ශ්‍රී ලංකා නාවික හමුදාවේ වැය ශීර්ෂය යටතේ වැටුප් ගෙවා තිබුණි. එම වියදම දෙපාර්තමේන්තුවේ වියදම් ප්‍රකාශයේ හෝ අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ වියදමක් ලෙස දක්වා නොතිබුණි. | මෙම දෙපාර්තමේන්තුවට අයත් කාර්ය මණ්ඩලය ද්විතීයික පදනම මත ශ්‍රී ලංකා නාවික හමුදාව වෙතින් අනුයුක්ත කර ඇති බැවින් ඔවුනට මෙම දෙපාර්තමේන්තුව ආරම්භයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා නාවික හමුදාව වෙතින් වැටුප් හා වේතන ගෙවා ඇත. තවද, ඉදිරි මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙල කිරිමේදි වෙරළ ආරක්ෂක පුද්ගලයන්ගේ වැටුප් හා වේතන දෙපාර්තමේන්තුවේ වියදම් ප්‍රකාශයට / අග්‍රිම සැසඳුම් ප්‍රකාශයට වියදමක් වශයෙන් ඇතුලත් කිරිමට සටහන් කර ගන්නා ලද බව. | වියදම් නිසි පරිදි පුරෝකථනය කර වැය විෂයයට අවශ්‍ය ප්‍රතිපාදන සලසා ගැනීමට කටයුතු කළයුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශුද්ධ ප්‍රතිපාදනය රු. 250,000,000 ක් වූ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ වැය විෂයයේ සමාලෝචිත වර්ෂය අවසාන දිනට ඉතිරිවීම් රු. 78,715,023 ක් වූ අතර එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 32 ක් විය. යාත්‍රාවන්හි නඩත්තු කටයුතු සැලසුම්කළ පරිදි ඉටු නොවීම, ප්‍රාග්ධන ස්වරූපයේ මිලදී ගැනීම් සිදු නොවීම මෙම ඉතිරිවීම් සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි. | යාත්‍රාවන් හි නඩත්තුව වෙනුවෙන් කල යුතු විදේශ මිලදී ගැනීම් සඳහා පවතින සීමා (උදා, විදේශීය මුදල් ඌණතාවය හේතුවෙන් LC සහ TT විවෘත නොවීම), වියදම් සීමා කිරිමේ අරමුණින් යාත්‍රා කරන පැය ගණන් සීමා කිරිම, සැපයුම්කරුවන් නිසි පරිදි යාත්‍රා අමතර කොටස් සැපයීමට අපොහොසත් වීම වැනි කාරණා හේතුවෙන් 2023 වර්ෂයේ තෙවන සහ සිව්වන කාර්තු වෙනුවෙන් යාත්‍රාවන්හි නඩත්තු කටයුතු නිසි පරිදි ඉටු කිරිමට අපොහොසත්වීම හේතුවෙන් වාර්ෂික ඉතිරිවීම් ඉහල අගයක් ගන්නා ලදී. | ප්‍රතිපාදන උපරිම කාර්යක්ෂමතාවය කින් යුතුව උපයෝජනය කළයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | යෝජිත නව ගොඩනැගිලි දෙකක් ඉදිකිරීමේ ව්‍යාපෘති සඳහා රු. 82,700,000 ක ශුද්ධ ප්‍රතිපාදන වෙන්කර තිබුණද, අදාල ඉදිකිරීම් කටයුතු අත්හැරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන දිනට ගොඩනැගිලි හා ඉදිකිරීම් වැය විෂයෙහි ඉතිරිවීම් රු. 68,989,858 ක් වූ අතර එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 83 ක් වී තිබුණි. | ඉදිකිරීම් භූමියේ හිමිකම සම්බන්ධයෙන් පවතින ගැටළුකාරී තත්වය හේතුවෙන් ශ්‍රී ලංකා වෙරළ ආරක්‍ෂක වරුණ ආයතනයේ ඉදිකිරීමට අනුමත ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට නොහැකි වී ඇති බැවින්, රුපියල් මිලියන 38 ක ප්‍රතිපාදන තුලින් එම ගොඩනැගිල්ලේ ඉදි කිරීම් සඳහා රු. 13,710,142 ක වටිනාකමකින් යුත් ගොඩනැගිලි ද්‍රව්‍ය මිලදී ගෙන ඇත. ශ්‍රී ලංකා වෙරළ ආරක්‍ෂක රෝහණ ආයතනයේ යෝජිත පස් මහල් ගොඩනැගිල්ලද අමාත්‍යාංශයේ වාචික උපදෙස් මත තාවකාලිකව නවතා ඇති අතර, ඒ සඳහා වෙන්කර ඇති රුපියල් මිලියන 51 ක ප්‍රතිපාදන උපයෝජනය වී නොමැත. මෙම ඉතිරිවීම් වලින් පුහුණු කටයුතු සඳහා රු.6,300,000 ක ප්‍රතිපාදන මාරු කිරීමෙන් පසුව මුළු ඉතිරිවීම රු.68,989,858 ක් ලෙස පෙන්නුම් කරනු ලබයි. | ප්‍රතිපාදන උපරිම කාර්යක්ෂමතාවය කින් යුතුව උපයෝජනය කළ යුතු වීම. |

**2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **වටිනාකම රු.** | **අනුකූල නොවීම** | | |
| මුදල් රෙගුලාසි 371 (2) (ආ) | - | මුදල් රෙගුලාසි 371 (2) (ආ) ප්‍රකාරව තත්ත්කාර්ය අතුරු අග්‍රිමය ලබා ගන්නා මාණ්ඩලික නිලධාරියා විසින් එම කාර්යය නිම කළ විගසම එම අග්‍රිමය පියවිය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ අතුරු අග්‍රිම 05 කට අදාළව අග්‍රිම පියවීම සඳහා කාර්ය නිම කිරීමෙන් පසු, දින 11 සිට දින 115 ක් දක්වා වූ කාල ප්‍රමාදයන් සිදු වී තිබුණි. | තත්කාර්ය අතුරු අග්‍රිමයන් ලබාගත් නෞකා සහ ආයතනයන් විසින් නොයෙකුත් වලක්වාගත නොහැකි පරිපාලනමය හේතූන් නිසා ඊට අදාල බිල්පත් ප්‍රමාද වී ඉදිරිපත් කිරීම හේතුවෙන් අතුරු අග්‍රිමයන් පියවීම සඳහා ප්‍රමාද වී ඇතත්, මින් ඉදිරියට නියමිත කාල සීමාව තුලදී අතුරු අග්‍රිමයන් පියවීමට සටහන් කර ගන්නා ලදි. තවද, මෙ සම්බන්ධයෙන් නෞකාවන් සහ ආයතනයන් ලිඛිතව දැනුවත් කිරීමට කටයුතු කෙරේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට හා 2024 වර්ෂයට අදාළව පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්මෙහි මූල්‍ය ඉලක්කයන් පමණක් ඇතුලත් කර තිබූ අතර භෞතික ඉලක්කයන් ඇතුළත් කර නොතිබුණි. | ක්‍රියාකාරි සැලැස්ම පිළියෙල කරනු ලබන්නේ ආරක්‍ෂක අමාත්‍යාංශය විසින් ලබා දෙනු ලබන ආකෘති පත්‍රයට අනුව වන අතර, 2025 වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්ම පිළියෙල කිරිමේදී විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි **'දෙපාර්තමේන්තුව වර්ෂය තුලදී අපේක්‍ෂිත භෞතික ඉලක්කයන් වෙතොත්'** ආරක්‍ෂක අමාත්‍යාංශය සමග සම්බන්ධිකරණයවී නිසි පරිදි ක්‍රියාකාරි සැලැස්මට ඇතුලත් කිරිමට කටයුතු කරන බව දැන්වේ. | ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමේදී සපුරාගත යුතු ඉලක්කයන් නිසි පරිදි පුරෝකතනය කල යුතු බව. |

### 3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **ධීවර යාත්‍රා නිරීක්ෂණය කිරීමේ තාක්ෂණික පද්ධති භාවිතා කිරීම**<br>ධීවර යාත්‍රාවන් තිබෙන ස්ථාන හා ගමන් මාර්ග නිරීක්ෂණය කළ හැකි VMS පද්ධති දෙපාර්තමේන්තුව සතුව නොමැති අතර සැක කටයුතු යාත්‍රා පිළිබඳව නාවික හමුදාවේ සහය මත ලැබෙන තොරතුරු උපයෝගීකරගෙන එම යාත්‍රා පරික්ෂා කිරීම් සිදු කරනු ලබන බව නිරීක්ෂණය විය. යාත්‍රා නිරීක්ෂණය සඳහා VMS පද්ධතිය භාවිතා කිරීමට නෛතික බලය දෙපාර්තමේන්තුවට ද ලබාගෙන ඒ තුළින් දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටුකිරීමට දායක කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ධීවර යාත්‍රා නිශ්චිත ස්ථාන නිරීක්‍ෂණය කිරීමේ VMS පද්ධතිය වෙරළ ආරක්‍ෂක දෙපාර්තමේන්තුව සතුව නොමැති අතර ඒ සම්බන්ධ ක්‍රියා කිරීමට නෛතික බලයක් වෙරළ ආරක්‍ෂක දෙපාර්තමේන්තුවට හෝ නාවික හමුදාවට නොමැති අතර ඒ සම්බන්ධව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලබයි. | යාත්‍රා නිරීක්ෂණය සඳහා VMS පද්ධතිය භාවිතා කිරීමට නෛතික ප්‍රතිපාදන සලසා ගතයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) (i) | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව සමග සම්බන්ධ වී ධීවර යාත්‍රා නිරීක්ෂණය කිරීමේ Blue Tracker AIS පද්ධතියට සම්බන්ධ වී ධීවර යාත්‍රා පරීක්ෂා කිරීමේ තාක්ෂණික පහසුකම ලබා ගෙන නොතිබුණි. | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව වෙතින් 2023 නොවැම්බර් මස 20 වන දින Blue Tracker AIS පද්ධතිය ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත ලබා දෙන ලෙස ඉල්ලා ඇති අතර එය ලබා දීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව දැනුම් දී ඇත. | තාක්ෂණික පහසුකම් ලබා ගැනීම සම්බන්ධයෙන් පසුවිපරම් කල යුතු බව. |
| (ii) | ශ්‍රී ලංකා මුහුදු තීරයේ පවතින බහුදින ධීවර යාත්‍රා සහ එක්දින ධීවර යාත්‍රා දෙපාර්තමේන්තුව මඟින් අදාල ධීවර වරායන්හි ලේඛණගත කර තිබුණද, එම යාත්‍රාවන්ට අදාල තොරතුරු ඇතුළත් කරමින් මධ්‍යගත දත්ත පද්ධතියක් සකස් කිරීමට කටයුතු කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශිය අධ්‍යක්ෂවරුන් විසින් ධිවර යාත්‍රාවන්හී තොරතුරු ඇතුලත් කිරීම සඳහා ධීවර කාර්යාල පිහිටුවා ඇති අතර මධ්‍යගත පද්ධතියක් සකස් කිරීමට මුදල් ප්‍රතිපාදන නොමැත. කෙසේ වෙතත් ආයතනයේ කායීය නියුතු විශේෂිත දැනුමක් ඇති පුද්ගලයන්ගේ දැනුම මත සෑම දත්තයක්ම එක් ස්ථානයකට දත්ත පද්ධතියක ගබඩාකර තබා ගැනීමේ ප්‍රයත්නයක යෙදී සිටී. | මධ්‍යගත දත්ත පද්ධතියක් සකස්කරගත යුතු බව. |

**3.3 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැල්ලවත්තෙහි පිහිටි වෙරළ ආරක්ෂක වරුණ ආයතනය සඳහා නේවාසික හා පරිපාලන පහසුකම් සහිත නව සිව් මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ පළමු අදියර වෙනුවෙන් 2022 සහ 2023 වර්ෂ වෙනුවෙන් රු. 40,000,000 ක ප්‍රතිපාදන වෙන්වී තිබුණි. එම ප්‍රතිපාදන වලින් 2022 වර්ෂයේ රු. 4,728,914 ක් සහ 2023 වර්ෂයේ රු. 13,052,119 ක් ලෙස එකතුව රු. 17,781,033 ක් වටිනා ඉදිකිරීම් ද්‍රව්‍ය මිළදී ගෙන වැල්ලවත්ත ප්‍රාදේශීය මූලස්ථානයේ ගබඩාකර තිබුණද ඉඩමේ අයිතිය සම්බන්ධ | එම අමුද්‍රව්‍ය ආරක්ෂිතව හා නිසියාකාරව ශ්‍රීලංවෙආ වරුණ ආයතනයේ ගබඩා කර ඇති අතර, පවතින දැව වර්ග (ප්ලයිවුඩ් හා II වන පංතියේ දැව) වර්ග කෘමි සතුන්ගෙන් හා මුහුද ආසන්නයේ පැවතීම හේතුවෙන් ඇතිවන පරිසර තත්ව මත විනාශ වීමේ අවධානමක් පවතී. මෙම ව්‍යාපෘතියට අදාලව 2022 වර්ෂයේ ගෙන්වන ලද දැව දැනටමත් විනාශවීමේ අවධානමකට ලක්ව ඇත. කරුණු එසේ හෙයින් මෙම | ඉදිකිරීම් ද්‍රව්‍යවල ආරක්ෂාව හා උපයෝජනය පිළිබඳ සුදුසු ක්‍රියාමාර්ගගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | ගැටලුව මත ඉදිකිරීම් නවතා දමා තිබුණි. මිළදී ගන්නා ලද අමුද්‍රව්‍ය කෘමි සතුන්ගෙන් හා මුහුද ආසන්නයේ පැවතීම හේතුවෙන් විනාශ වී යාමේ අවධානමක් පැවතුණි. | ව්‍යාපෘතියට අදාල අමුද්‍රව්‍ය වෙනත් ව්‍යාපෘතියකට යොමු කිරීමට හෝ වෙනත් සුදුස්සක් කිරීමට යෝජනා කර ඇත. | |

**3.4 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවේ අනුබණ්ඩ 07 ක් රජයේ වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සතු විවිධ ස්ථානවල පිහිටි එකතුව පර්චස් 478.09 ක්වූ භූමි ප්‍රමාණයක පවත්වාගෙන යනු ලබන අතර එම ඉඩම් දෙපාර්තමේන්තුවට පවරාගැනීම සිදුව නොතිබුණි. | දෙපාර්තමේන්තුව සතු අනුබණ්ඩ පවත්වාගෙන යාම සඳහා දෙපාර්තමේන්තුවට අයත් නොවන ඉඩම් භාවිතා කරන අතර එම ඉඩම් හිමි පාර්ශවයන්ගෙන් ඉඩම් වල හිමිකාරිත්වය ශ්‍රී ලංකා වෙරළ ආරක්‍ෂක දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමේ කටයුතු කරමින් පවතී. | ඉඩම් පවරා ගැනීමේ කටයුතු කඩිනමින් අවසන් කරගත යුතු බව. |
| (ආ) | දෙපාර්තමේන්තුවේ වරුණ ආයතනයට අයත් ගල්කිස්ස ජීවිතාරක්ෂක මුරකුටිය පිහිටි පර්චස් 17.9 ක ඉඩමට අදාල බදු ගිවිසුම 2022 සැප්තැම්බර් 30 දින අවසන් වී තිබුණද, එය අළුත් කිරීමට 2023 දෙසැම්බර් දක්වා කටයුතු කර නොතිබුණි. | ගල්කිස්ස ජීවිතාරක්‍ෂක මුරකුටිය පිහිටි ඉඩමේ බදු ගිවිසුම යාවත්කාලීන කර ගැනීමේදී එම ඉඩම් හිමිකාරිනිය විදේශගත වි සිටින බැවින් යාවත්කාලීන කිරීමේ කටයුතු ප්‍රමාද වන බවට දැනුම් දී ඇත. | බදු ගිවිසුම යාවත්කාලීන කරවාගෙන නෛතික හිමිකාරිත්වය ලබාගත යුතු බව. |
| (ඇ) | ශ්‍රී ලංකාව වටා ඇති නාවික සැතපුම් 148,721 ක දුර ප්‍රමාණය ආවරණය කිරීම සඳහා දෙපාර්තමේන්තුව සතුව නෞකා 04 ක හා යාත්‍රා 27 ක ඇණියක් පවතින අතර ඉන් 2023 වර්ෂයේ දී ක්‍රියාකාරී තත්ත්වයේ පැවති නෞකා හා යාත්‍රා ප්‍රමාණය 22 ක් විය. අක්‍රීය තත්ත්වයේ පවතින යාත්‍රා 09 න් යාත්‍රා 06 ක් අළුත්වැඩියා කිරීමට ප්‍රතිපාදන නොමැතිවීම මත හා ඉල්ලුම්කරන ලද අමතර කොටස් නොලැබීම මත අවුරුදු තුනකට වඩා වැඩි කාලයක සිට භාවිතයට ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | මෙම යාත්‍රා අළුත්වැඩියාව සඳහා ප්‍රතිපාදන නොමැති වීම ,අමතර කොටස් ඉල්ලුම්කර තිබීම ,ක්‍රියාකාරී තත්වයට පත්කිරීමට ආසන්නව පැවතීම, අළුත්වැඩියා වියදම ඉහල බැවින් සුදුස්සක් කිරීමට නියමිතව තිබීම වැනි හේතු බලපා ඇත. | යාත්‍රා ක්‍රියාකාරීතතත්ත්වයට පත්කර ගැනීමට කටයුතු කල යුතු බව හා ක්‍රියාකාරී තත්ත්වයන්ට පත් වී ඇති යාත්‍රා නිසි පරිදි නඩත්තු කටයුතු සිදු කල යුතු බව |

## 3.5 කළමනාකරණ දුර්වලතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 වර්ෂය තුළදී වෙරළ ආරක්ෂක විෂයයට අදාල දේශීය හා විදේශීය පුහුණු පාඨමාලා සම්පූර්ණ කරන ලද නිලධාරීන් හා නාවිකයින් 13 දෙනෙකු අදාළ පුහුණු පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් පසු මාසයකට අඩු කාලයක සිට මාස 09 ක කාලයක් තුළදී නැවත නාවික හමුදාව වෙත අනුයුක්ත කර තිබීමෙන් එම නිළධාරින් හා නාවිකයින්ගෙන් දෙපාර්තමේන්තුවට ලබාගත හැකිව තිබූ සේවාව අවම වී තිබුණි. එමෙන්ම විදේශීය පුහුණු පාඨමාලාවලදී එම පුහුණු පාඨමාලාවේ බැඳුම්කරයේ සඳහන් අවම කාලසීමාවන් සම්පූර්ණ කිරීමට ප්‍රථම දෙපාර්තමේන්තු සේවාවෙන් ඉවත්ව යාමට සිදු වී තිබු අවස්ථාද විගණනයට නිරික්ෂණය විය. | පාඨමාලාවන් හදාරන ලද වෙරළ ආරක්‍ෂක පුද්ගලයින් පාඨමාලාවන් අවසන් විමෙන් පසු ඉදිරි වසර දෙකකට ආසන්න කාලයක් වෙරළ ආරක්‍ෂක රාජකාරින් සඳහා රඳවා තබා ගැනිම සිදු කරනු ලබයි.කරුණු එසේ වුවද නොවැලැක්විය හැකි කරුණු හේතුවෙන් ඔවුන් නාවික හමුදාව වෙත මාරු කර යැවිමට ඇතැම් අවස්ථාවලදි සිදුවේ. | පුහුණු පාඨමාලා සඳහා අදාල ගිවිසුම් ප්‍රකාර කටයුතු කළයුතු වීම. |
| (ආ) | වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තු පනත පරිච්ඡින්න කර නව පනතක් සම්පාදනය කිරීම සඳහා 2016 වර්ෂයේ දී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නව පනත සම්පාදනය කිරීමට අපොසහාසත් වී තිබුණි. | වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තු පනත පරිච්ඡින්න කර නව පනතක් සකස් කර ඉදිරි ක්‍රියාමාර්ග සඳහා ආරක්ෂක අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. | නව පනත සම්පාදනය කඩිනමින් අවසන් කළයුතු වීම. |
| (ඇ) | නිල ඇඳුම් නිකුත් කිරීමේදී දෙපාර්තමේන්තුව තුළ ක්‍රියාත්මක පරිගණක පද්ධතියේ ගැටළුකාරී තත්වය මත තොගය යාවත්කාලීන වීමේ දෝෂයක් පැවතියද එම පරිසණක පද්ධතිය ක්‍රමවත් කිරීමේ කටයුතු අවසන් වී නොතිබුණි. | පරිසණක පද්ධතිය නිසි අයුරින් ක්‍රමවත්ව යාවත්කාලින කිරීම සඳහා තොරතුරු තාක්‍ෂණික දෙපාර්තමේන්තුව දැනුවත් කිරීමට කටයුතු කල අතර, එය ශ්‍රී ලංකා නාවික හමුදාවේ පවතින ක්‍රමවේදයට අනුව සකස් කිරීම සඳහා 2024 අප්‍රේල් මස 09 වන දිනැති ලිපිය මගින් ඉල්ලුම් කර ඇත, ඒ සඳහා නිසි ක්‍රියාමාර්ග මේ වන විට සිදු කරමින් පවතී. | පරිගණක පද්ධතිය යාවත්කාලීන කර පවත්වාගත යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | දෙපාර්තමේන්තුවේ බටහිර ප්‍රාදේශීය මූලස්ථානය පිහිටි පර්චස් 132.64 ක් වූ වැල්ලවත්ත භූමිය මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ වැඩි දියුණු කිරීමේ ආයෝජන ව්‍යාපෘතිය සඳහා කොළඹ මහ නගර සභාව වෙත පවරා ගැනීමට කටයුතු කරමින් පැවතියද, මෙම ප්‍රාදේශීය මූලස්ථානය පිහිටුවීම සඳහා සුදුසු භූමියක් සොයා ගැනීමට දෙපාර්තමේන්තුවට නොහැකි වී තිබුණි. | වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ බටහිර ප්‍රාදේශිකය, වැල්ලවත්ත පිහිටි ඉඩමෙන් ඉවත්කර ගැනීමට සිදුවුවහොත් ඒ සඳහා වැල්ලවත්ත ප්‍රදේශයෙන් හෝ ඊට ආසන්නතම ස්ථානයකින් සුදුසු භූමියක් ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ආරක්ෂක අමාත්‍යාංශය මගින් ඉල්ලීම් කර ඇත. | සුදුසු භූමියක් ලබා ගැනීම සිදු කළ යුතු වීම. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා වටා ඇති මුහුදු තීරය දෙපාර්තමේන්තුවේ රාජකාරී අවශ්‍යතාවය මත කලාප හතරකට බෙදා ඇති අතර එම කලාප හතර සඳහා 573 ක කාර්යය මණ්ඩලයක් සමාලෝචිත වර්ෂය අවසාන දිනට අනුයුක්ත කර තිබුණු අතර තවදුරටත් 106 ක කාර්යය මණ්ඩලයක් අවශ්‍ය බවට හඳුනාගෙන තිබුණි. එසේ වුවද, එම එක් එක් කලාපය සඳහා අනුයුක්ත කළ යුතු අනුමත කාර්යය මණ්ඩලය නිශ්චිතව හඳුනාගෙන නොතිබීම නිසා කාර්යමණ්ඩලයේ අපහසුතාවයක් හෝ අතිරික්තයක් පවතීද යන්න නිශ්චිතව ප්‍රකාශ කළ නොහැකි විය. | එක් එක් ප්‍රාදේශිකය සඳහා රාජකාරිමය වශයෙන් ඌණතාවය පවතින වෙරළ ආරක්ෂක පුද්ගලයින් සංඛ්‍යාව පහත පරිදි වන අතර, එම පිරිස අනුයුක්ත කර ගැනීමට නාවික හමුදාව සමග සම්බන්ධිකරණය වී කටයුතු සිදු කරමින් පවතී.<br>(1) ප්‍රාදේශීය දකුණු බළ ප්‍රදේශය - 38<br>(2) ප්‍රාදේශීය බටහිර බළ ප්‍රදේශය - 39<br>(3) ප්‍රාදේශීය නැගෙනහිර බළ ප්‍රදේශය - 23<br>(4) ප්‍රාදේශීය උතුරු බළ ප්‍රදේශය - 25<br><br>තවද, වෙරළ ආරක්ෂක නෞකා/ යාත්‍රා උතුරු, නැගෙනහිර, බටහිර සහ දකුණ යන ප්‍රාදේශිකයන් 4හි ස්ථානගතකර ඇති අතර, මෙහෙයුම් අවශ්‍යතාවයන්, සේවා සහ අළුත්වැඩියා කටයුතු සඳහා එම යාත්‍රාවන් ප්‍රාදේශිකයන් අතර, හුවමාරුවීම සිදුවන බවත් එක් ප්‍රාදේශිකයට අයත් පිරිස් ප්‍රමාණයන් නියත අගයක පවත්වා ගැනීමට නොහැක. | එක් එක් කලාපය සඳහා ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් අනුමත කරවා ගැනීමට හා අනුයුක්ත කර ගැනීමට ක්‍රියා කළ යුතු වීම. |